කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමගින්, ඒ සම්බන්ධ පුවත් වාර්තා කිරීමේදී තමන් ගන්නා ප්‍රවේශය සහ යොදාගන්නා භාෂාව පිළිබඳව නැවත නැවතත් සිතා බලන මෙන් මාධ්‍යවේදීන්ට සිහිපත් කිරීමට සිදුවී තිබේ. මෙහිදී ආසාදිතයින් රෝගය පතුරුවන්නා වූ වරදකරුවන් ලෙසින් චිත්‍රණය කිරීමෙන් වළකින ලෙසත්, කොවිඩ්-19 හා බැඳි යෙදුම් නිෂේධනාත්මක ආකාරයකින් පුද්ගලයින්ට ආරෝපණය කරනා භාෂාවක් යොදා නොගන්නා ලෙසත් අපි තරයේ සිහිපත් කරමු. ඊට හේතුව වන්නේ, ඉහත ආකාරයේ ආචාර ධර්මීය නොවන මාධ්‍යකරණයක් ඔස්සේ සමාජය තුළ කොවිඩ්-19 ආසාදිතයින් කෙරෙහි ගර්හාත්මක, කොන් කිරීමේ ආකල්පයක් ඇතිවීමත්, ඊට බියෙන් රෝගීන් වෛද්‍ය ප්‍රතිකාර වෙත යොමු නොවී සැඟවීමත් සිදුවිය හැකි බැවිනි. එය කොවිඩ්-19 මර්දන ව්‍යායාමයන්ට බාධාවක් බව අමුතුවෙන් කිව යුතු නොවේ.

මෙවැනි ආචාර ධර්මීය නොවන වාර්තාකරණයට උදාහරණයක් ලෙසින් ලංකාදීප පුවත්පතේ (10/28) පුවතක උපසිරස්තලයේ දැක්වෙන "දොස්තර පුතා කොරෝනා පියා බලන්න ගිහින්" යන්න පෙන්වා දිය හැක. මෙහිදී "කොරෝනා පියා" වැනි නිෂේධනාත්මක යෙදුමකින් ආසාදිතයාව හැඳින්වීම කෙතරම් ශිෂ්ට සම්පන්නද? සමස්ත පුවත් වාර්තාව ගත් විට, එහි ආසාදිතයාට වරද පැටවීමේ ස්වරයක් ඇතැයි ඔබට හැඟෙනවාද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #NewsPapers #Lankadeepa**